# පළමු පරිච්ඡේදය

## 1.1 හැඳින්වීම

නළුවා යනු රංගනය හා සබැඳි නිර්මාණ කාර්යයේදී ඉතා වැදගත් පුද්ගලයෙකි. සිනමා කලාව තුළ නිහඬ යුගයේදී සිටි නළුවන් හා අධ්‍යක්ෂකවරුන් අතර ඉතා වැදගත් ස්ථානයක් චාලි චැප්ලින්ට හිමි වෙයි. ඔහුගේ සිනමා නිර්මාණයන් තුළ ඇති පාදඩයා (The Tramp) චරිතය තුළින් ගැඹුරු යටි අරුතක් ඇති මතුපිටින් සරල භාෂ්‍යයක් උපදවන සිනමා කෘති නිර්මාණය කර ඇත.

චැප්ලින් සිය පාදඩයා චරිතය සිනමාවට ගෙනෙන්නේ සිය දෙවන සිනමා කෘතිය වූ Kid Auto Races in Venice කෘතිය හරහා ය. ඒ වන විට ඔහුගේ වයස අවුරුදු 24 කි.

නූතන සිනමාව තුළ ද චැප්ලින්ගේ මඟ අනුගමනය කළ ද එහෙත් තමන්ට ම ආවේනික වූ රංග ශෛලියක් ගොඩනගාගත් නළුවකු වෙයි. ඔහු නමින් රෝවන් ඇට්කින්සන් ය. Mr.Bean චරිතය ඔහු විසින් ගොඩනංවන ලද ප්‍රබල උපහාසාත්මක චරිතයකි. රෝවන් ඇට්කින්සන් Mr. Bean චරිතය පිළිබඳව කියන්නේ වැඩුණු සිරුරක් තුල සිටින කුඩා දරුවෙක් ලෙස ය. (A Child a Grown man's body)

චැප්ලින්ගේ පාදඩයා චරිතය සිනමාව තුළ පමණක් තිබුණක් වුවද ඇට්කින්සන්ගේ Bean චරිතය මුලින් ම එළි දැක්වුනේ ටෙලි නාට්‍ය මාලාවක් ලෙසිනි. 1990 සිට 1995 දක්වා කොටස් 14 කින් යුක්තව Bean ටෙලි නාට්‍ය මාලාව නැරඹූ පිරිස මිලියන 18.74 ක් විය. Bean චරිතය නිහඬ යුගයේ සිනමාවට බොහෝ සමීප බව විචාරකයින් පවසයි.

නිහඬ යුගයේ පාදඩයා හා අද්‍යතන බීන් අතර ඇත්තේ එම සමාජ පරිසරය තුළින් ම හටගත් චරිතයක ගොඩනැංවීමකි. චැප්ලින් විසින් සිය පාදඩයා (The Tramp) චරිතය ගෙන එන කාලයේ එනම් 1914 දී පමණ තිබූ සමා විපර්යාසයන් තුළින් පාදඩයා චරිතය බිහි විය.

**'චැප්ලින් රඟ පෑ චරිත හාස්‍යයෙන් යුතු වුවද නිරතුරුව ම පීඩනය හා සූරාකෑම පිටුදකින චරිතයන් වූහ"[1]**

චැප්ලින්ගේ හා රෝවන් ඇට්කින්සන්ගේ රංගන කාර්යය තුළින් මතුවන සමාජ කථිකාවත පිළිබඳ විග්‍රහ කිරීමේදී ඔවුන් සිනමා නිර්මාණ කළ යුගයේ යුරෝපියානු සමාජය බෙහෙවින් ම ඔවුන්ගේ සිනමා කෘතිවලට බලපෑවේය. සමාජය තුළ ඇති ගැටුම්, පන්ති අරගල, ආකෘතිගතවීම්, ආදී නොයෙකුත් සන්දර්භයන් මේ දෙදෙනා සිය කෘති සඳහා වස්තු විෂය කොට ගත්හ.

1. මැක්වෙල් රොජර්, සිනමාව හා ජන සමාජය, එම්. වී. මහින්දපාල, සරසවි ප්‍රකාශකයෝ, 2006, 27 පිටුව

එමෙන් ම මාක්ස්වාදය, පශ්චාත්නූතනවාදය වැනි දාර්ශනික කථිකාවත් සරල ප්‍රක්ෂේපණ මාධ්‍යයක් වන සිනමාව ඔස්සේ සමාජය වෙත යොමු කිරීමට මේ දෙදෙනා උත්සාහ දරා ඇත. ඒවායේ ගැඹුරු දාර්ශනික බව හාස්‍යය ඔස්සේ සරල කරගනිමින් එය වටා ඔවුහු සිය නිර්මාණ කළහ. චැප්ලින් වූ කලී පැරණි යුරෝපීය සමාජයේ පන්ති අරගලය, ධනපති පන්තිය විසින් නිර්ධන පන්තිය සූරා කෑම වැනි වූ මාක්ස්වාදී අදහස් දරන සංසිද්ධීන් සිය කෘති තුළින් එළි දක්වනු ලැබූ අතර බීන් චරිතය තුළින් ගොඩනැංවූයේ අද්‍යතන යුරෝපය සම්බන්ධව වූ කථිකාවතක් ය. යුරෝපයේ ආකෘතිකවාදය තුළ සිරවී හුදකලා වූ මිනිසා ඇට්කින්සන්ගේ බීන් චරිතයට දායක විය.

මේ දෙදෙනාගෙන් සිනමාව තුළ කෙරෙන කාර්යභාරයන් තුලනාත්මකව අධ්‍යයනය කිරීමෙන් ''පුංචි පාදඩයා'' හා ''බීන්'' ගේ ජනමාත්මක ගොඩනැංවීම පිළිබඳව අපට පැහැදිළිව ම දැකගත හැකිය. නළු කාර්යයෙන් ඔබ්බට ගිය, අධ්‍යක්ෂකවරයෙක් හෝ රචකයෙක් ලෙස මොවුන් දෙදෙනා ම ගෙන ආවේ තමන්ගේ නිර්ව්‍යාජ අදහස් ය. නමුත් චැප්ලින් සිය කෘතිවල රචකයා විය, අධ්‍යක්ෂකවරයා විය, සංගීත නිර්මාණකරු ද ඔහු ම විය. නමුත් ''බීන්'' සිනමා කෘති හුදෙක් ඇට්කින්සන්ගේ ම නිර්මාණයක් නොවේ. ඇතැම්විට ඒවායේ පිටපත් රචකයා ඔහු වන අතර අධ්‍යක්ෂක වෙනත් අයෙකි.

කෙසේ වුවද චාලි චැප්ලින් සහ රෝවන් ඇට්කින්සන් හාස්‍ය රංගන ශිල්පීන් ලෙස හාස්‍ය රංගන ක්ෂේත්‍රයේ ප්‍රබල තැනක රැඳී සිටි, තවමත් රැඳී සිටින මේ අසහාය නිර්මාණකරුවන් දෙදෙනා පිළිබඳව ප්‍රබල හැදෑරීමක් කළ යුතු කාලය එළඹ ඇත. ඔවුන් දෙදෙනාගේ දර්ශනය තුළින් පිළිබිඹු වන සමාජ කථිකාවත පිළිබඳව සාකච්ඡා කිරීමට කල් එළඹ ඇත. මතුපිටින් පෙනෙන හුදු හාස්‍යය ඉක්මවා ගිය දාර්ශනික මතවාදයක් ගොඩ නැංවීමට මේ නිර්මාණකරුවන් දෙදෙනා සමත් වී ඇති බව අපට පැහැදිළි වේ.